සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Department of Education - Sabaragamuwa Province

# මධ්‍යවාර පරීක්ෂණය - 2021

7 ශ්‍රේණිය | භූගෝල විද්‍යාව | කාලය පැය 02

නම ඃ- .................................... විභාග අංකය ඃ- .....................

## I කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 01 සිට 10 දක්වා ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් සම්පූර්ණ කරන්න.

1. පෘථිවිය තම අක්ෂය වටා ගමන් කිරීම ............... ලෙස හඳුන්වයි.(භ්‍රමණය,පරිභ්‍රමණය,පරිවහනය)
2. පෘථිවි ගෝලයේ මතුපිට වර්ගඵලය වර්ග කිලෝමීටර් මිලියන...............කි.(510,610,710)
3. පෘථිවි ආදර්ශ ගෝලයේ බටහිර සිට නැගෙනහිරට විහිදෙන මනඃකල්පිත රේඛා ................වේ. ( දින රේඛා, දේශාංශ, අක්ෂාංශ )
4. සාගරයෙන් වට වූ විශාල ගොඩබිම් ප්‍රදේශ .............ලෙස හැඳින් වේ.(දූපත්,මහද්වීප,සාගර)
5. බෙංගාල බොක්ක ප්‍රදේශයේ හට ගන්නා කැළඹීම් නිසා .............ඇති වේ.(සංවහන, වාසුළි, මෝසම්)

- අංක 06 සිට 10 තෙක් දී ඇති ප්‍රකාශ කියවා එය නිවරැදි නම් "නි" යන්න වටා ද වැරදි නම් "වැ" යන්න වටා ද රවුමක් අඳින්න.

6. මධ්‍යම කඳුකරයේ කඳු,සානු,මාර්ග,දුර්ග හා දිය ඇලි යන භූ ලක්ෂණ බහුලව පිහිටා නැත.(නි/වැ)
7. පැසිෆික් සාගරය ලෝකයේ විශාල ම සාගරය වේ.(නි/වැ)

8. කිසියම් රටක ආසන්න වටපිටාවේ ඇති සාගර ගොඩබිම් ආදිය පදනම් කරගෙන පිහිටීම දැක්වීම සාපේක්ෂ පිහිටීම දැක්වීම නම් වේ.( නි/වැ)

9. ශ්‍රී ලංකාවේ නිරිත හා ඊසාන දෙසින් රට තුළට ඇතුළු වන කාලීන සුළං ධාරා මෝසම් සුළං ලෙස හැඳින් වේ.( නි/වැ)

10. ශ්‍රී ලංකාව බහු වාර්ගික හා බහු ආගමික සංස්කෘතියක් ඇති රටකි.( නි/වැ)

- ප්‍රශ්න අංක 10 සිට 15 තෙක් ප්‍රශ්නවලට හිස්තැනට සුදුසු පිළිතුර යොදා සම්පූර්ණ කරන්න.

11. පෘථිවිය සූර්යයා වටා පරිභ්‍රමණය වීමට ගත වන කාලය දින ........කි.

12. පෘථිවිය ගෝලාකාර වස්තුවක් ලෙස සැළකුව ද .......... ගෝලයක් නොවේ.

13. ශ්‍රී ලංකාවේ වෙරළ මායිමේ සිට නාවුක සැතපුම් 12 ක මුහුදු තීරය ........මුහුද ලෙස හඳුන්වයි.

14. සංස්කෘතික උරුමයන් අතර සිංහරාජය ..........නිර්මිතයකි.

15. කැස්පියන් හා එරල් මුහුද ..........මහද්වීපය තුළ පිහිටා ඇත.

- ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

16. කර්කටක නිවර්තනය පිහිටා ඇත්තේ සමකයට,

I. උතුරින් ය.
II. දකුණින් ය.
III. බටහිරින් ය.
IV. නැගෙනහිරින් ය.

17. ශ්‍රී ලංකාවේ දෙවුන්දර තුඩුවේ සිට පේදුරු තුඩුවට ඇති දුර,

I. කි.මී.210
II. කි.මී.432
III. කි.මී.510
IV. කි.මී.410

18. අර්ධ ශුෂ්ක ප්‍රදේශවල දක්නට ලැබෙන වෘක්ෂලතා වර්ගය වන්නේ,

I. තද කොළ පැහැති ශාක ය.
II. වියන් සහිත ගස් ය.

III. කටු පඳුරු සහිත වන ලැහැබ් ය.
IV. ඝන වනාන්තර ය.

19.හේන් වගාව බහුලව දක්නට ලැබෙන්නේ,

I. තෙත් කලාපයේ ය.
II. වියළි කලාපයේ ය.
III. කඳුකර තෙත් කලාපයේ ය.
IV. අතරමැදි කලාපයේ ය.

20.දකුණු ආසියා කලාපයේ ඉහළ ම සමාජීය සංවර්ධනයක් සහිත රට වන්නේ,

I. ඉන්දියාව යි.
II. පකිස්ථානය යි.
III. බංගලාදේශය යි.
IV. ශ්‍රී ලංකාව යි.

(ලකුණු 2 x 20=40)

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

1. පහත දැක්වෙන ලෝක සිතියම අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




I. A අක්ෂරයෙන් දැක්වෙන සාගරය නම් කරන්න.
( ල.01 )

II. B අක්ෂරයෙන් දක්වා ඇත්තේ මහද්වීපයකි.එය නම් කරන්න.
( ල.01 )

III. C අක්ෂරයෙන් දක්වා ඇති සමුද්‍ර සන්ධිය කුමක්ද?
( ල.02 )

IV. D අක්ෂරයෙන් දක්වා ඇති දූපත නම් කරන්න.
( ල.02 )

V. කැස්පියන් මුහුද දැක්වෙන්නේ කුමන අක්ෂරයෙන්ද?
( ල.02 )

VI. සමකය දැක්වෙන අක්ෂරය කුමක්ද?
( ල.02 )

VII. F අක්ෂරය මඟින් සේයා කර ඇති රට නම් කරන්න.
( ල.02 )

( ල.12 )

2.

I. ශ්‍රී ලංකාවේ ප්‍රධාන භූ විෂමතා කලාප තුන නම් කරන්න.

(ල.03)

II. වෙරළබඩ තැනිතලාවේ දක්නට ලැබෙන භූ විෂමතා ලක්ෂණ හතරක් සඳහන් කරන්න.

(ල.04)

III.

a) ශ්‍රී ලංකාවේ උතුරින් පිහිටා ඇති මහද්වීපය හා දකුණින් පිහිටා ඇති සාගරය නම් කරන්න.

(ල.02)

b) ශ්‍රී ලංකාව ඉන්දියාවට ආසන්නව පිහිටීම නිසා ලැබී ඇති වාසි දෙකක් සඳහන් කරන්න.

(ල.03)

3.

I. ශ්‍රී ලංකාවට වැසි ලැබෙන ක්‍රම තුන නම් කරන්න.

(ල.03)

II. ශ්‍රී ලංකාවේ තෙත් ප්‍රදේශවල වනාන්තර ආශ්‍රිතව දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(ල.04)

III.

a) පහත දැක්වෙන ස්ථානවල වෘක්ෂලතා ලක්ෂණ එක බැගින් සඳහන් කරන්න.

A. කඳුකර ප්‍රදේශවල
B. වියළි හා අර්ධ ශුෂ්ක ප්‍රදේශවල
C. වෙරළ ආශ්‍රිත කලපුවල

(ල.03)

b) වනාන්තරවලින් ඇති ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න.

(ල.02)

4.

I. ශ්‍රී ලංකාවේ ආදිවාසී ජනතාව ජීවත්වන ප්‍රදේශ තුනක් සඳහන් කරන්න.

(ල.03)

II. අපේ සංස්කෘතික උරුමයන් කිහිපයක් පහත දැක්වේ.ඒවා ස්පෘශ්‍ය උරුම හා අස්පෘශ්‍ය උරුම ලෙස වෙන් කරන්න.

ශ්‍රී මහා බෝධිය,සීගිරිය,නැටුම් ගැයුම්,සිරිත් විරිත්,දිය ඇළි,ආගන්තුක සත්කාර

(ල.04)

III.

a) ශ්‍රී ලංකාවේ ඇති ලෝක උරුම දෙකක් සඳහන් කරන්න.

(ල.02)

b) ආදිවාසී ජනතාව නූතන ජන සමාජයට අනුවර්තනය වීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න.

(ල.03)

5. ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයේ රූප සටහනක් පහත දැක්වේ.ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




I. A හා B වලින් දක්වා ඇති කඳු දෙක නම් කරන්න.

(ල.03)

II.

a) C හා D වලින් දැක්වෙන ඇති සානු දෙක නම් කරන්න.

(ල.02)

b) මෙම කලාපයේ බහුලව ම වගා කරන භෝගය කුමක්ද?

(ල.01)

c) මෙම ප්‍රදේශයේ මාර්ග ජාලයේ දැකිය හැකි ප්‍රධාන ලක්ෂණයක් ලියන්න.

(ල.01)

III.

a) මෙම ප්‍රදේශයෙන් පටන් ගන්නා ගංගා දෙකක් සඳහන් කරන්න.

(ල.02)

b) දෙස් විදෙස් සංචාරකයන් මධ්‍යම කඳුකරයේ පරිසරයට ඇලුම් කිරීමට බලපාන හේතු දෙකක් කෙටියෙන් විස්තර කරන්න.

(ල.03)

6.

I. දකුණු ආසියා කලාපයේ රටවල් තුනක් නම් කරන්න.

(ල.03)

II. රටක අධ්‍යාපන පහසුකම් වැඩි දියුණු වීම මඟින් ඇති වන වාසි දෙකක් ලියන්න.

(ල.03)

III.

a) ශ්‍රී ලංකා ජන සමාජයේ පවතින සංස්කෘතික උත්සව දෙකක් සඳහන් කරන්න.

(ල.02)

b) ශ්‍රී ලංකාවේ සමාජ සංවර්ධනය ඉහළ මට්ටමක පැවතීම සඳහා බලපාන සාධක දෙකක් සඳහන් කරන්න.

(ල.03)

7.

I. වියළි කලාපීය භූ දර්ශනය ඇති වීමට බලපා ඇති සාධක දෙකක් සඳහන් කරන්න.

(ල.03)

II.

a) මෙම කලාපයේ ඇති ශේෂ කඳු දෙකක් ලියන්න.

(ල.02)

b) මෙම ප්‍රදේශයේ ප්‍රධාන වගාව කුමක්ද?

(ල.02)

III.

a) මෙම කලාපයේ පිහිටා ඇති වනෝද්‍යාන දෙකක් සඳහන් කරන්න.

(ල.02)

b) වියළි කලාපීය භූ දර්ශනය තුළ ජල හිඟයට පිළියම් ලෙස ගෙන ඇති විසඳුම් දෙකක් සඳහන් කරන්න.

(ල.03)

සැකසුම- ඒම්.ජී.සී.කේ.රාජමන්ත්‍රී මිය
ර/බල/බෙලිහුල්ඔය ධම්මරතන ම.වි.